ටවර් හෝල් රඟහල පදනම - 2022
---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ටවර් හෝල් රඟහල පදනමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍යා ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 80 (ඇ) ඡේදය ප්‍රකාරව වාර්තා කරන දිනෙන් පසු මාස 12 ක් ඇතුළතදී නිරවුල් කිරීමට නියමිත වගකීම්, ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවද 2023 වර්ෂයේදී විශ්‍රාම ගැනීමට නියමිත සේවකයින් තිදෙනෙකුට අදාළ රු.1,345,805 ක්වූ පාරිතෝෂික සඳහා වෙන් කිරීම්, ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. | ඉදිරියේදි මෙවැනි විශ්‍රාම ගැනිම් සඳහා පාරිතෝෂිත වෙන්කිරිම ගිණුම් තුල නිවැරදිව ගැලපීම් සිදු කිරිමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබුණු ප්‍රධාන කාර්යාලීය ඉඩම හා ගොඩනැගිල්ල ඇතුළුව 2022 දෙසැම්බර් 31 දිනට පැවති වටිනාකම රු. 942,000,000 ක් වූ පදනම සතු ඉඩම් 03 ක් හා රු.584,828,968 ක් වූ ගොඩනැගිලි 05 ක් සමාලෝචිත වර්ෂය අවසාන | මෙම ප්‍රත්‍යාගණන කටයුතු සඳහා අවශ්‍ය වන තක්සේරු වාර්තාව ලබා ගැනිමට මූලික කටයුතු 2022 වර්ෂයේ සිදු කර ඇති අතර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය ලිපි කටයුතු යොමු කර ඇත. 2022 වර්ෂයේ රටේ පැවති කලහාකාරි තත්වය මත සිදු වූ රාජ්‍ය දේපල අලාභ හානිය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වන විටත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | තක්සේරු කටයුතු රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉටුකරන බැවින් අප ආයතනයේ තක්සේරු කටයුත්ත 2022 වර්ෂයේ අග භාගයේදි ඉටුකිරිමට කටයුතු යොදා ඇති බව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දැනුම් දුන් නමුත් මේ වන තෙක් එම කාර්ය ඉටු නොවූ බැවින් නැවත වරක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇත. කෙසේ නමුත් මෙම තක්සේරු කටයුත්ත 2023 වර්ෂයේදි සිදු කර ගැනීම සඳහා සියළුම පියවරයන් ගන්නා බව සඳහන් කරමි. | |
| (ඇ) | සේවා කාලය වසර 05 සම්පූර්ණ නොවූ එහෙත් සමාලෝචිත වර්ෂය වනවිට අඛණ්ඩව මාස 12 ක කාලයක් සේවය කරන ලද සේවකයින්/ නිලධාරීන් දස දෙනෙකු වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 62 ඡේදය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා රු.230,375 ක පාරිතෝෂික වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට නිවැරදි කිරිමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 12 ඡේදය ප්‍රකාරව ක්ෂය කලහැකි වත්කම්වලට අදාල රාජ්‍ය ප්‍රදාන, අදාල වත්කම්වල ක්ෂය වියදමට සමානුපාතිකව කාල පරිච්ඡේදය තුල ලාභයට හෝ අලාභයට විලම්භීත අයභාරය ලෙස හඳුනාගත යුතු වුවත් පදනම විසින් සමාලෝචිත වර්ෂයට අදාල රු.47,344,638 ක් වූ විලම්භීත අයභාරය වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | 2023 වර්ෂයේදි නිවැරදි කිරිමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ටවර් හෝල් රඟහල පදනම සතු 2017 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.161,750,000 ක් වූ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල හා රු. 1,250,000 ක් වූ ශබ්දාගාරය වෙනුවෙන් 2017 | ශබ්දාගාරය හා ගොඩනැගිල්ල 2022 වර්ෂයේ සිට ක්ෂය කර ගිණුම් ගත කිරිම ආරම්භ කරන ලද අතර පෙර වර්ෂ සඳහා ගැලපීම් සිදු නොකරන ලදී. | වත්කම් ප්‍රත්‍යාගණනය කළ දිනයේ සිට ඊට අදාල ක්ෂය ගැලපීම් සිදු කිරීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළව ක්ෂය ගැලපීම් සිදු කර නොතිබීම හේතුවෙන් සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු. 81,500,000 කින් අඩුවෙන් හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පෙර වර්ෂ ගැලපීම් තුලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.23,196,800 ක් වුවද, ඊට අනුරූපී ස්ථාවර තැන්පතුවල ආයෝජන වටිනාකම රු.20,752,432 ක් විය. | පාරිතෝෂිත සඳහා මුදල් වෙන්කිරිම් මූල්‍ය අර්බුදය මත පසුගිය වසර කිහිපයකම සිදු නොවුනි. 2023 වර්ෂයේදි ඒ සඳහා වෙන්කරන ලද ස්ථාවර තැන්පතු දෙකෙන් රු.7,250,432 ක්වූ ස්ථාවර තැන්පතුව රු.8,000,000 දක්වා වැඩි කර, වාර්ෂික පොලි අනුපාතය 30% ක් වැනි ඉහල පොලියක් සහිත රාජ්‍ය බැංකුවක මාසික පොලිය ලබා නොගැනීමේ පදනමින් වසර 05කට ආයෝජනය කරන ලදී. 2023 වසරේ සිට එම මුදල් වෙන් කිරීමේ හිඟය වාර්ෂික පොලි ආදායමෙන් පියවා ගත හැකි වේ. | පිළිතුරේ දක්වා ඇති පරිදි ආයෝජනය වැඩි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව පාරිතෝෂික ගෙවීම් රු.1,642,130 ක් ලෙස දක්වා තිබුණද වර්ෂය තුල ගෙවූ පාරිතෝෂික වටිනාකම රු.1,709,865 ක් වූයෙන් පාරිතෝෂික ගෙවීම් රු. 67,735 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | පාරිතෝෂිත වෙන් කිරීමේදී රු.67,735 ක පෙර වර්ෂයේ ඌන වෙන් කිරීමක් සිදු වී ඇත. එම පාරිතෝෂිත ගෙවීමේදි පෙර වර්ෂයේ ගැලපීම් තුලින් සිදු කර ඇත. එය අවසන් ගිණුම් ප්‍රකාශයේ පිටු අංක 22 හි පෙර වර්ෂයේ ගැලපීම් තුල දක්වා ඇත. එබැවින් මෙම වෙනස සිදු වී ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදලින් ගෙවන ලද වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය. |
| (ඈ) | සංචිත ගිණුමට ගැලපීම් කර තිබූ වත්කම් ප්‍රත්‍යාගණනය මත ජනිත වූ ලාභ, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් නොවන නමුත් 2022 වර්ෂයේදී වාහන ප්‍රත්‍යාගණනය තුලින් ජනිත වූ රු.34,670,000 ක ලාභය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව දැක්වීමට කටයුතු කරමි. | මුදලින් ජනනය නොවූ ලාභ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දැක්වීම නිවැරදි කළ යුතුය. |
| (ඉ) | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සංචිත යටතේ ප්‍රසාංගික කලාකරුවන් සඳහා වූ ජනාධිපති සුභසාධන අරමුදල් ශේෂය රු.60,399,700 ක් වුවද අදාල සුභ | අවසන් ගිණුම් වල සංචිත යටතේ රුපියල් 60,399,700 ලෙස දක්වා ඇත්තේ ජනාධිපති සුභසාධක අරමුදලට වරින් වර | ස්ථාවර තැන්පතු වටිනාකමට සාපේක්ෂව අරමුදලේ ශේෂය පවත්වා ගත |

| | | | |
|---|---|---|---|
| | සාධක අරමුදල නමින් වූ ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.70,999,700 ක් විය. ඒ අනුව අරමුදලේ ශේෂය රු.10,600,000 ක් අඩුවෙන් දැක්වුණු අතර ඒ සඳහා හේතු අනාවරණය නොවීය. | ලැබුණු මුදල් වල එකතුවක් වශයෙනි. එය ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඉන් ලැබෙන පොලි ආදායමෙන් කලාකරුවන්ට ප්‍රතිලාභ ගෙවීමෙන් පසු ඉතිරි වන අතිරික්ත මුදල් නැවත ආයෝජනය කර එම අරමුදල රුපියල් 70,999,700 දක්වා වර්ධනය කර ඇත. මේවන විට එම අතිරික්ත මුදල වන රුපියල් 10,600,000 ක මුදල අවසන් ගිණුවල සංචිත යටතේ සමුච්චිත ලාභය තුල ඇතුලත්ව ඇත. 2023 වර්ෂයේදි එම මුදල සමුච්චිත ලාභයෙන් ජනාධිපති සුභසාධක අරමුදලට මාරු කිරිමට අවශ්‍ය කටයුතු කරන බව සඳහන් කරමි. | යුතු අතර වාර්ෂිකව ඉතිරිවන අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී සමුච්චිත ලාභයෙන් ඉවත් කර අරමුදල් ගිණුමට මාරු කළ යුතුය. |
| (ඊ) | ටවර් වෘත්තියාභිමුඛ සංසදය අරමුදල් ශේෂය රු.276,900 ක් වුවද අදාල අරමුදල නමින් වූ ස්ථාවර තැන්පතු මුදල රු.100,000 ක් විය. ඒ අනුව අරමුදලේ ශේෂයට සාපේක්ෂව තැන්පතු මුදල රු.176,900 ක් අඩුවෙන් ආයෝජනය කර තිබුණු අතර මේ පිළිබඳ පූර්ව වර්ෂ විගණන වාර්තා මඟින්ද පෙන්වා දී ඇතත් මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | අවසන් ගිණුම් තුල සංචිත යටතේ වෘත්තියාභිමුඛ සංසදය නමින් රු. 276,900ක මුදලක් පැවතියද, එය මේ වන විට ටවර් වෘත්තියාභිමුඛ සංසදය අරමුදල නමින් ලංකා බැංකුවේ ඉතිරි කිරිමේ ගිණුමේ රු.717,015/- ක ශේෂයක් පවතී. එක් එක් අවස්ථාවල නාට්‍ය පාසලේ නිෂ්පාදිත නාට්‍ය පෙන්වීම තුලින් ලද ආදායම් ගිණුමට එකතු වී මෙම ශේෂය සෑදී ඇත. ඊට අමතරව රුපියල් 100,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත. ඉතිරි කිරිමේ ගිණුමේ ශේෂය ස්ථාවර තැන්පතු තුල ආයෝජනය නොකරන ලද්දේ නාට්‍ය නිෂ්පාදනය සඳහා විවිධ වියදම් දැරිමට සිදු විය හැකි බැවිනි. නමුත් 2023 වර්ෂයේදි එම මුදල සමුච්චිත ලාභයෙන් ටවර් වෘත්තියාභිමුඛ සංසදය අරමුදලට මාරු කිරිමට අවශ්‍ය කටයුතු කරන බව සඳහන් කරමි. | ස්ථාවර තැන්පතු වටිනාකමට සාපේක්ෂව අරමුදලේ ශේෂය පවත්වා ගත යුතු අතර වාර්ෂිකව එකතුවන පොලී මුදල් සමුච්චිත ලාභයෙන් ඉවත් කර අරමුදල් ගිණුමට මාරු කළ යුතු අතර වියදමට සරිලන මුදල් ප්‍රමාණයක් පමණක් ඉතිරි කිරීමේ ගිණුමේ රඳවා ගෙන ඉතිරිය ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | මූලා ප්‍රකාශනය අනුව ස්ථාවර තැන්පතු පොලී ආදායම රු. 22,010,386 ක් වුවද උපලේඛනය අනුව පොලී ආදායම රු.21,461,065 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූලා ප්‍රකාශන හා උපලේඛන අතර රු.549,321 ක වෙනසක් නිරීක්ෂණය විය. | ස්ථාවර තැන්පතු පොලිය ගණනය කිරිමේදි සමහර බැංකු දින ගණනට පොලිය සකස් කරන අතර සමහර බැංකු විසින් මාසයට අදාලව පොලිය ලබා දෙනු ලබයි. එබැවින් විගණන විමසුම් මගින් සකස් කිරිමට පෙන්වා දෙන ලද ලේඛණය (අවසන් ගිණුම් උපලේඛණය) හා සත්‍ය වශයෙන් පොලි ලැබීම අතර වෙනස්කම් පවති. | කාලපරිච්ඡේදයට අදාල දින ගණන අනුව පොලී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම රු. 14,082,645 ක් වුවද, 2022 වර්ෂයේ මූලා ප්‍රකාශන අනුව එය රු.14,202,278 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 119,633 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉහත "එ" හී සඳහන් පිළිතුර | පොලී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම් වලට ගත යුතුය. |
| (එ) | 2022 ජනවාරි 01 දිනට ජර්නල් වවුචරයක් මඟින් ගිණුම්වල ආරම්භක ශේෂ ඉදිරියට ගෙන ඒම සිදුකළ යුතු වුවද පදනම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරිමේදි නිවැරදි ලෙස ගිණුම් ගත කිරිමට කටයුතු කරමි. | ආරම්භක ශේෂයන් ගිණුම්වල ඉදිරියට ගෙන ඒමේදී ජර්නල් වවුචරයක් මගින් සිදු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සංචිත | 79,368,600 | වසර ගණනාවක් තිස්සේ ගිණුම්වලින් ඉදිරියට ගෙන එන ගිණුම් ශේෂයන් 05 ක් පිළිබඳ තොරතුරු/ ලිපිගොනු/ ලේඛන. | මෙම සියළුම ශේෂයන් පිළිබඳව ආරම්භයේ සිට සකස් කරන ලද අවසන් ගිණුම් නැවත වරක් පරික්ෂාකර බලා අවශ්‍ය කටයතු සිදු කරන ලෙස විගණන හා කළමණාකරන රැස්වීමේදි උපදෙස් ලැබිණි. | විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සව්සිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම වෙත පවරාදීමට අදාල 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන් | i. මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත් එම කාර්යයන් සඳහා නොයෙදවන ලද්දේ නම් එවිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණද පදනම සතු සව්සිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අවස්ථා 02 කදී වසර 30 බැගින් බදු දී තිබුණි. | ටවර් හෝල් රඟහල පදනම පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වන අරමුදල් රැස්කර ගැනීමේ අරමුණින් ටවර් හෝල් රඟහල පදනම සතු ඕනෑම දේපලක්, ගොඩනැගිල්ලක්, භූමියක් බදුදීම, විකිණීම යන කරුණු සඳහා භාරකාර මණ්ඩලයට අනුමැතිය ලබාදී ඇති කාරුණිකව සඳහන් කරමි. | විශේෂ දීමනා පත්‍රයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| | | ii. විධිමත් අනුමැතියකින් හා විධිමත් පත්වීමක් නොලද අධ්‍යක්ෂ ජනරාල්වරයකු අත්සන් තබන ලද නීත්‍යානුකූල නොවන ලිඛිත බදු ගිවිසුමක් මගින් වසර 30 ක කාලයක් සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට නැවත බදු දීම සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 13 දිනැති අංක CAA/A/THTF/2021/05/Q 10 දරන විගණන විමසුමට අදාළව 2023 ජනවාරි 09 දිනැති පිළිතුරු ලිපියෙන් පදනමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම වරද නිවැරදි කරන බව දක්වා තිබුණද එසේ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2014 වසරේ සිට ගිවිසුම් කාලය අවසන් වීම සම්බන්ධයෙන් ලිපි යොමු කර ඇත. නමුත් සව්සිරිපාය ගොඩනැගිල්ල භාර නොදී අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ මට්ටමෙන් භාරකාර මණ්ඩල තීරණ වලට පටහැනිව ගිවිසුම අත්සන් කර තිබීම වරදක් බව පිළිගනිමි. එම වරද නිවැරදි කර ගැනීම සඳහා මේ වන විටත් අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් එක් රැස්වීමක්ද, අග්‍රාමාත්‍ය ලේකම් ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ආයතන ප්‍රධානීන් සමඟ තවත් රැස්වීමක් ද පවත්වා ඇත. රජයේ | තක්සේරු වටිනාකමට අනුව කඩිනමින් නව බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දේපලක් සහ රාජ්‍ය ආයතන 02 ක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලකට අදාල ගැටළුවක් බැවින් නීතිමය පියවර ගැනීමට අවස්ථාවක් නොමැති බව කාරුණිකව සඳහන් කරමි. | |
| | | iii. පදනම විසින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සමග ඇති කරගත් මූලික බදු ගිවිසුමේ, බදු ගැනුම්කරුවන්ට සම්පූර්ණ බදු දේපල හෝ ඉන් කොටසක් හෝ අතුරු බදු | අදාල ගැටලුව විසඳීමට පියවර ගනිමින් සිටින බව කාරුණිකව සඳහන් කරමි. | නව ගිවිසුමකට එළඹීමේදී පැරණි ගිවිසුමේ ඇති අතුරු බදු දීමේ කොන්දේසිය ඉවත් කර |
| | | දීමට බලය ඇත්තේය, යන ලෙස කොන්දේසි ඇතුළත් වගන්තියක් පදනමට අවාසි වන අයුරින් ඇතුළත් කිරීම හේතුවෙන් එම අධිකාරිය විසින් වර්ග අඩි 2017 ක වපසරියක් 2021 ජූලි 01 දින සිට 2023 ජුනි 30 දින දක්වා කාලපරිච්ඡේදයට ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) වෙත රු.227,000 ක මාසික කුලියකට අතුරු බදු දී තිබුණි. තවද එම අධිකාරියට බදු දී තිබුණු ගොඩනැගිල්ලට අයත් ශ්‍රවණාගාරයද කුලී පදනමට බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි. | | වෙනත් ආයතන වලට බදු දීම පදනම විසින් පමණක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/ 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය | පිළියෙල කර තිබූ පදනමේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුල පුනරාවර්තන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම නිසි ලෙස සකස් කර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම්, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් | භාරකාර මණ්ඩල රැස්වීම් පැවැත්වීම ප්‍රමාද වීම හේතුවෙන් භාරකාර මණ්ඩල අනුමැතිය | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය | කළ යුතු වුවද පදනම විසින් 2022 වර්ෂයට අදාල ගිණුම් 2023 මැයි 19 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | සහිතව 2022 අවසන් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම ප්‍රමාද වූ නමුත් 2023 වර්ෂයේ මාර්තු මස පැවති විගණන හා කළමණාකරණ රැස්වීමට අවසන් ගිණුම් ඉදිරිපත් කර එහි කෙටුම්පතක් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. 2023 වර්ෂයේ සිට නොපමාව ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව සදහන් කරමි. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය අතිරේක මුදල් ප්‍රමාණය සපයා ගැනීම නව උපාය මාර්ගයක් මගින් සිදුකළ හැකි බව සඳහන් කරමින් රු. 3,000 ක් ව පැවති විශ්‍රාම වැටුප් දීමනාව රු. 7,500 ක් දක්වා වැඩි කිරීමට අංක 2019/294/03/01 දරන භාරකාර මණ්ඩල පත්‍රිකව මගින් අනුමැතිය ලබාදී තිබුණද විගණිත දින වන විටත් කිසිදු නව උපාය මාර්ගයක් හඳුනාගෙන නොතිබුණු අතර මේ හේතුවෙන් 2022 වර්ෂය සඳහා ජනාධිපති සුබසාධක අරමුදලේ රු.7,435,500 ක් වූ දීමනා ගෙවීමට අරමුදලේ තැන්පතු පොලී ආදායම ප්‍රමාණවත් නොවීම මත අවස්ථා 07 කදී පදනමේ අංක 2327541 දරන ජංගම ගිණුමෙන් රු.1,816,000 ක මුදලක් ලබාගෙන තිබුණි. | එවක අග්‍රාමාත්‍යතුමාගේ තීරණය භාරකාර මණ්ඩලය විසින්ද අනුමත කර තිබුණි. ආදාල පත්‍රිකාවේ විකල්ප නව උපාය මාර්ග ගන්නා ලෙස යෝජනා කර තිබුණත් එවැනි කිසිදු උපාය මාර්ගයක් සිදු කර නොතිබුණි. ජනාධිපති සුහසාධක අරමුදලට වරින් වර රජයේ ප්‍රදාන ලැබුණද පසුගිය වර්ෂවල එස රජයේ ප්‍රදානද නොලැබුණි. ජනාධිපති සුහසාධක අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ග 02 කි.<br>01. ස්ථාවර තුන්පතු පොළී ආදායම,<br>02. භාරකාර මණ්ඩල අනුමැතිය සහිතව ටවර් හෝල් රඟහල පදනම වෙත කලාපුර ඉඩම් ආදාල කලාකරුවන් විසින් අලෙවි කිරිම තුලින් ලැබෙන මුදලින් 10%ක මුදල,<br>කෙසේ වෙතත් මේ වන විට නව උපාය මාර්ග සපයා ගෙන ඇත. වර්තමානයේ ස්ථාවර තැන්පතු සඳහා ඉහල පොලී ආදායමක් ලැබෙන බැවින් එම ආදායමෙන් සුහසාධන වියදම් ගෙවූ පසු ඉතිරිවන මුදලින් නව ස්ථාවර තැන්පතු ආරම්භ කර එම අරමුදල වර්ධනය කරගනිමින් සිටී. එම නිසා ඉදිරියේදි පොලී අනුපාත පහල ගියද එම සුහසාධන වියදම් ගෙවීමේදි ආයතනයේ මුදල් ප්‍රවාහයට බාධාවකින් තොරව කරගෙන යාමට හැකියාව ඇත | නව උපාය මාර්ග ලෙස ඉතිරි මුදල් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම දක්වා තිබුණද ස්ථාවර තැන්පතු ආයෝජන පොලිය උච්චාවචනය වන බැවින් වෙනත් විකල්ප මාර්ග සපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.80,792,883 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 77,244,487 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,548,396 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වෙනත් දීමනා, ඉන්ධන හා ලිහිසි තෙල් වියදම්, අළුත්වැඩියා සහ නඩත්තු වියදම්, විදුලි වියදම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ටවර් හෝල් රඟහල පදනම පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන ඒ සඳහා කමිටුවක් පත්කර වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධන ඇතුලත් කරන ලදී. දැනට සංශෝධන ඇතුලත් පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. එම දෙපාර්තමේන්තුව විසින් ලැබුණු පසු කැබිනට් මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු මෙම කාර්යය අවසන් කළ හැකි බව කාරුණිකව සඳහන් කරමි | කඩිනමින් පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.3,000 ක්ව පැවති දීමනාව රු.7,500 දක්වා වැඩි කිරීම හේතුවෙන් දැනට අරමුදල සිටින ප්‍රතිලාභීන්ටද ප්‍රතිලාභ ගෙවීමේ දුෂ්කරතාවලට මුහුණ දී තිබුණු අතර 2014 වර්ෂයේ සිට අයදුම්පත් යොමුකරන ලද ප්‍රාසාංගික කලාකරුවන් 50 කට වැඩි ප්‍රමාණයකට විශ්‍රාම දීමනා ලබා ගැනීමට නොහැකිව වසර ගණනක් පොරොත්තු ලේඛනයේ රැඳී සිටීමටද සිදුව තිබුණි. මෙම අරමුදල සම්බන්ධයෙන් නිවැරදි තීරණ නොගැනීම හා අරමුදල නිසි ලෙස කළමනාකරණය කිරීමට පියවර නොගැනීම හේතුවෙන් ජනාධිපති සුභසාධක අරමුදල පිහිටුවීම මඟින් අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට පසුගිය වර්ෂ කිහිපය තුලදීම පදනම අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය කෙරේ. | පිළිගනිමි.වර්තමානය වන විට අරමුදල නිසි ලෙස කළමනාකරණය කර ඇති අතර අරමුදල ශක්තිමත් කිරීමට කටයුතු යොදා ඇත. | මූල්‍ය ශක්‍යතාවය පිළිබඳ සලකා බලා අරමුදල් වර්ධනය කර ගැනීමේ ක්‍රමවේදයන් ඇති කිරීමෙන් පසු දීමනා ඉහල නැංවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පදනමේ බඳවාගැනීමේ පරිපාටියට පටහැනිව "නඩත්තුකරු" තනතුර සඳහා සුදුසුකම් සපුරා නොමැති තැනැත්තෙකු මෙම තනතුර සඳහා බඳවාගෙන තිබුණි. | ආයතනය පවත්වාගෙන යාමට අවශ්‍ය මෙම තාක්ෂණික තනතුරු පිරවීම සඳහා වසර ගණනාවක සිට පුවත්පත් දැන්වීම් පළකර බඳවා ගැනීමට සූදානම් කර තිබුණ ද සුදුසුකම් සපුරා ඇති අයෙක් ඉදිරිපත් නොවූ බව සඳහන් කරමි. ඒ අනුව මෙම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ NVQ 4 සපුරා ඇති මෙම අයදුම්කරු නඩත්තුකරු ලෙස බඳවා ගෙන ඇත. තවද බඳවා ගැනීම් පටිපාටිය තුළ ද NVQ 4 සුදුසුකම සහිත අයෙකු බඳවා ගත යුතු ය ලෙස සඳහන් කර ඇත. | බඳවා ගැනීමේ පරිපාටියට අනුව කටයුතු කළ යුතු අතර එසේ නොවන්නේ නම් බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමෙන් පසු අදාල බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |